# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.01.30 පැය 1615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/177/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**බීමත්ව රිය පදවා අනතුරක් සිදුකල පොලිස් නිලධාරියාගේ වැඩ තහනම් කිරීම - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

පොලිස් ජීප් රථයක් සහ ත්‍රීරෝද රථයක් එකිනෙක ගැටී අනතුරක් සිදුවන ආකාරයත්, අනතුරුව පොලිස් ජීප් රථය නොනවත්වා ධාවනය කරන ආකාරයත් දැක්වෙන වීඩියෝ පටයක් පසුගියදා සමාජ මාධ්‍ය හරහා සංසරණය විය.

මෙම සිදුවීම 2025.01.28 වන දින රත්මලාන ප්‍රදේශයේ සිදු වූ සිදුවීමක් වන අතර එදිනම මේ පිළිබඳව ගල්කිස්ස පොලිස් ස්ථානය මඟින් විමශර්න සිදු කර ජීප් රථය පැදවූ පොලිස් කොස්තාපල් රියදුරුවරයා අත්අඩංගුවට ගෙන ඇත. එහිදී ඔහු බීමතින් රිය ධාවනය කර ඇති බවට තහවුරු වී ඇති අතර සැකකරු ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. එමෙන්ම එම නිලධාරියාගේ වැඩ තහනම් කිරීමටද කටයුතු කර ඇත. මේ පිළිබඳව ගල්කිස්ස පොලිසිය මඟින් වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**